# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1405/3 - 2005 අගෝස්තු 11 වැනි බ්‍රහස්පතින්දා - 2005.08.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. ඕ. 11/80 (II-**ග**

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ පෝෂණ සහ
ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍ය.

2005 අගෝස්තු මස 05 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග ආහාර (ලුණු අයඩීනීකරණය කිරීමේ) නියෝග 2005 යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2005 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු, අපිරිසිදු ද්‍රව්‍ය සෝදා හැර ලබා ගන්නා ලද ලුණුවලට පොටෑසියම් අයඩයිඩ්, පොටෑසියම් අයඩේට් හෝ කැල්සියම් අයඩේට් එකතු කර ඇත්තා වූ ද වියලි පදාර්ථ පදනමක් මත සෝඩියම් ක්ලෝරයිඩ් බරෙන් සියයට අනූ හතකට (97%) අඩු නොවන ප්‍රමාණයක් අන්තර්ගත වන්නා වූ ද සාමාන්‍ය ලුණු වශයෙන් තිබිය යුතු ය :

එසේ වුවද ලුණු අයඩීනීකරණය සඳහා පොටෑසියම් අයඩයිට් භාවිත කරන්නේ නම් සුදුසු ස්ථායි කාරකයක් භාවිත කළ යුතු වේ.

3. අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු මැටි, සියුම් ගල් හෝ වැලි කැට, සිප්පි කටු කැබලි සහ වෙනත් බාහිර ද්‍රව්‍ය සහ දෘශ්‍යමාන අපිරිසිදු ද්‍රව්‍යවලින් තොර සුදු වර්ණයෙන් යුතු වූ කුඩු ලෙස හෝ කැට ආකාරයෙන් පවතින ස්ඵටික කල ඝන ද්‍රව්‍ය විය යුතු ය.

4. අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය කැටලුණු සියයට අසූවක ප්‍රමාණයක් (80%) මිලී මීටර් 4.75 (බී. ඇස්. 4) විවර සහිත පෙනේරයක් තුළින් ගමන් කරවීමට හැකි විය යුතුය.

5. අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු පහත සඳහන් නියමයන්ට අනුකූල විය යුතුය.

(අ) එම ලුණුවල තෙතමනය බරෙන් සියයට හයකට (6%) වඩා අඩු විය යුතු ය ;

(ආ) වියළි පදනමක් මත ජලයේ දිය නොවන ද්‍රව්‍ය බරෙන් සියයට භාගයකට (0.5%) වඩා අඩු විය යුතුය ;

(ඇ) වියළි පදනමක් මත සෝඩියම් ක්ලෝරයිඩ් (NACL) ප්‍රමාණය බරෙන් සියයට අනූ හතකට (97%) වඩා අඩු නොවිය යුතු ය ;

(ඈ) වියළි පදනමක් මත සෝඩියම් ක්ලෝරයිඩ් හැර ජලයේ දියවන ද්‍රව්‍යවල ප්‍රමාණය බරෙන් සියයට දෙකකට (2%) වඩා අඩු විය යුතු ය ; සහ

(ඉ) වියළි පදනමක් මත ලුණුවල ඇති අයඩීන් (I) ප්‍රමාණය ලුණු කිලෝ ග්‍රෑම් එකකට අයඩීන් මිලිග්‍රෑම් පහළොවකට (මිලිග්‍රෑම් 15) වඩා අඩු නොවිය යුතු අතර අයඩීන් මිලිග්‍රෑම් තිහකට (මිලිග්‍රෑම් 30) වඩා වැඩි නොවිය යුතු ය.

6. අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු විනිවිද පෙනෙන ඇසුරුම්වල ඇසිරිය යුතුය. ඇසුරුම් ද්‍රව්‍ය පොලිතීන් වන අවස්ථාවක එම ඇසුරුමේ ඝනකම මයික්‍රෝ මීටර් 75 කට වඩා අඩු නොවිය යුතු ය ;

එසේ වුව ද මේසය මත තබන ඉසින කුඩු වශයෙන් භාජනවල බහා පාවිච්චියට ගනු ලබන අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු සඳහා මෙම නියෝගවල විධිවිධාන අදාළ නොවේ.

7. (අ) අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු අන්තර්ගත ඇසුරුම් සඳහා ලේබල් කිරීම 2005.01.19 දින අංක 1376/9 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන 2005 ආහාර (ලේබල් කිරීම සහ ප්‍රචාරය කිරීමේ) නියෝගවලට අනුකූලව සිදු කළ යුතු ය.

(ආ) අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු ඇතුළත් යම් ඇසුරුමක ලේබලය මත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් යම් භාෂා දෙකකින් පහත දැක්වෙන වචන මුද්‍රණය කර හෝ ලියා තැබිය යුතු ය :—

(i) නිෂ්පාදනයේ පොදු නාමය “අයඩීනීකරණය කරන ලද කෑමට ගන්නා සාමාන්‍ය ලුණු” හෝ “අයඩේට් යෙදූ කෑමට ගන්නා සාමාන්‍ය ලුණු” ;

(ii) “නොසෝදා පාවිච්චි කරන්න” යන වචන ;

(iii) “හිරු එළිය සහ තාපය ඇති ස්ථානවලින් බැහැරව ගබඩා කර තබන්න” යන වචන.

8. අයඩීනීකරණය කරන ලද හෝ අයඩේට් යෙදූ සාමාන්‍ය ලුණු හැර වෙනත් කිසිම කෑමට ගන්නා සාමාන්‍ය ලුණු වර්ගයක්, ආහාරවල සහ ආහාර නිෂ්පාදනය කිරීම සඳහා මිශ්‍රණ ද්‍රව්‍යයක් ලෙස භාවිත කරන ලුණු ඇතුළුව, මිනිස් පරිභෝජනයේ කාර්ය සඳහා නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සඳහා ගබඩාකර තැබීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු ය.

එසේ වුව ද කර්මාන්තවල කාර්ය සඳහා කර්මාන්තය ප්‍රධාන ආහාර බලධරයා වෙත ලියාපදිංචි කිරීමෙන් පසු එම ප්‍රධාන ආහාර බලධරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක බලතල යටතේ එම කර්මාන්තයේ කාර්ය සඳහා සාමාන්‍ය ලුණු භාවිත කිරීම සම්බන්ධයෙන් මේ නියෝගවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

9. 8 වන නියෝගය යටතේ අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් මේ නියෝගවල I වන උපලේඛනයේ දක්වා ඇති නියමිත ආකෘති පත්‍රයට අනුව සාදා තිබිය යුතු ය.

10. 9 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් මේ නියෝගවල II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව විය යුතු ය.

11. 1993 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 788/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1993 ආහාර (අයඩීන් මිශ්‍ර ලුණු) රෙගුලාසි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

I වන උපලේඛනය

(9 වන නියෝගය)

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
(ප්‍රධාන ආහාර බලධරයා)
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කර්මාන්තවල කාර්ය සඳහා සාමාන්‍ය ලුණු මිළදී ගැනීම/ආනයනය කිරීම/ප්‍රවාහනය කිරීම සඳහා වූ අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. කර්මාන්තයේ වර්ගය/නම :————.

4. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය :————.
(ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න.)

5. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනයේ නම (උදා. අයඩීකරණය කරන ලද ලුණු නිෂ්පාදනය/වෙනත්) :————.

6. නිෂ්පාදනයෙහි කොටසක් ලෙස සාමාන්‍ය ලුණු භාවිත කර ඇති ප්‍රතිශතය :————.

7. අයඩිනීකරණය කරන ලද සාමාන්‍ය ලුණු භාවිත නොකිරීමට/භාවිත කිරීම අවශ්‍ය නොවීමට හේතු (අයඩිනීකරණය කරන ලද ලුණු භාවිත නොකරන අවස්ථාවල) :————.

8. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

*කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි.*

ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයාගේ සහතිකය

1. ඉල්ලුම්කරු විසින් ඉහත සඳහන් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය මා විසින් යථා පරිදි පරීක්ෂාකොට ඔහුගේ ප්‍රකාශ සත්‍යායනය කළෙමි.

2. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ සත්‍ය හා නිවැරදිය.

3. ඉල්ලුම්කරුගේ කර්මාන්තය සාර්ථක ලෙස පවත්වා ගෙන යාම සඳහා ඉල්ලුම්කරුට මාස ………… සඳහා සාමාන්‍ය ලුණු කි. ග්‍රෑ. ………… අවශ්‍ය වේ.

4. සටහන්.

ආහාර හා ඖෂධ පරීක්ෂක
නිල මුද්‍රාව.

දිනය :————.

*නිර්දේශය*

නිර්දේශ කරමි/නිර්දේශ නොකරමි
සහකාර අධ්‍යක්ෂ (ආහාර පාලන ඒකකය)

සහකාර අධ්‍යක්ෂ,
(ආහාර පාලන ඒකකය).

දිනය :————.

---

අධ්‍යක්ෂවරයාගේ (පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය) අනුමැතිය.
අනුමත කරමි/අනුමත නොකරමි.

අධ්‍යක්ෂ,
(පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය).

දිනය :————.

---

## II වන උපලේඛනය

(10 වන නියෝගය)

කර්මාන්ත සඳහා වූ සාමාන්‍ය ලුණු මිළදී ගැනීම/ආනයනය කිරීම/ප්‍රවාහනය කිරීම/ගබඩා කිරීම සඳහා වූ අවසර පත්‍රය

ජාතික හැඳුනුම්පත් අංක:..............................දරන............................................පදිංචි....................................මයා/මිය/මෙනෙවිය විසින් පවත්වාගෙන යනු ලබන ....................................පිහිටි...................................... නමැති ..............................කර්මාන්තය සඳහා 2005.08.11 දින අංක 1405/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 ආහාර (ලුණු අයඩිනීකරණය කිරීමේ) නියෝග ප්‍රකාරව ඉහත සඳහන් ඔහුගේ/ඇගේ කර්මාන්තය සම්බන්ධයෙන් සාමාන්‍ය ලුණු කිලෝ ග්‍රෑම්.................................... මිළදී ගැනීම/ආනයනය කිරීම/ප්‍රවාහනය කිරීම/ගබඩා කිරීම සඳහා මෙයින් අවසර දෙනු ලැබේ.

අධ්‍යක්ෂ (පරිසර හා වෘත්තීය සෞඛ්‍ය),
ප්‍රධාන ආහාර බලධරයා වෙනුවට.

*(සටහන)*

1. මෙම අවසර පත්‍රය වලංගු වන්නේ අවසර පත්‍රයේ සඳහන් සාමාන්‍ය ලුණු ප්‍රමාණය මිළදී ගැනීම/ආනයනය කිරීම/ප්‍රවාහනය කිරීම/ගබඩා කිරීම සඳහා පමණි. මෙම අවසර පත්‍රය දරන්නාට ලුණු නිෂ්පාදකයකු විසින් සෑම ප්‍රමාණයක් නිකුත් කිරීමේදීම අවසර පත්‍රය තුළ නොමැකෙන තීන්තෙන් නිකුත් කළ ලුණු ප්‍රමාණය සහ නිකුත් කළ දිනය සඳහන් කළ යුතු ය. ආනයනික ලුණු සම්බන්ධයෙන් වන විට, නිෂ්කාශනය කරන අවස්ථාවේදී අවසර පත්‍රය සත්‍යායනය කිරීම සහ සටහන් කිරීම සඳහා ආනයනය කරන ලද ආහාර පරීක්ෂා කිරීමේ ඒකකය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. මිළදී ගනු ලැබූ/ආනයනය කරන ලද ලුණු තොගය එදිනම ප්‍රවාහනය කරනු නොලැබුවහොත්, ලුණු නිකුත් කළ ආයතනය විසින් හෝ ආනයන ආහාර පරීක්ෂණ ඒකකයේ නිලධරයකු විසින් ඒ පිළිබඳ සටහනක් අදාළ අවසර පත්‍රයේ කළ යුතු ය. එවැනි සටහනක් නොමැති අවසර පත්‍රයක්, ලුණු මිළදී ගත් දින හෝ වරායෙන් නිෂ්කාශනය කළ දින හැර වෙනත් දිනයකදී ප්‍රවාහනය කිරීම සඳහා වලංගු නොවනු ඇත.

08-884

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.